# සාරාංශය


ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රයන්ට අනුව

# පෞද්ගලීකරණය

# ශ්‍රී ලංකාවේ වතු මංකොල්ලකෑම

***Amazon Books** - 'IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 1 : Pillage of the Plantations in Sri Lanka'*


***http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php***




*විශාලත්වය- 8.25" X 11" - පිටු ගණන 248*

මෙම ග්‍රන්ථයෙන් මනාසේ එළිදරව් වන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (World Bank) සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) න්‍යාය පත්‍රයන්ට අනුව සිදු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඓතිහාසික මුල්ගල වූ, මිල කළ නොහැකි ජාතික වස්තුවක් වූ වැවිලි වතුයායන්, විශේෂයෙන් තේ සහ රබර් වතු, ඉතා ඛේදජනක ආකාරයට පෞද්ගලීකරණය කිරීමය.

මෙම වතු ජනසතු කිරීමට හේතු වුයේ 1974 දෙසැම්බර් මස නියෝජිතායතනය හා තැරව්කාර සමාගම් පිළිබද වූ පරීක්ෂණ කොමිෂන් සභාවේ 'බර්නාඩ් සොයිසා වාර්තාව' නමින් හැදින්වූ වාර්තාවෙන් මෙම වතු පාලනයේ දූෂිත අක්‍රමිකතා හෙළිදරව් වීමෙනි. එනම් මෙම වතු වල සැලකිය යුතු අරමුදල් එම වතු කළමණාකරණය කල කොළඹ නගරය මුල් කරගත් නියෝජිතායතනය විසින් අත්කර ගෙන ඇති අතර, වෙනත් කරුණු අතරතුර, මෙම වතු වල ප්‍රධාන පාර්ශවකරුවන් වූ එහි සේවකයන්ට නිසි ලෙස හිමි විය යුතු අයිතීන් ඔවුනට අහිමි වීමයි. එනම්:



SESSIONAL PAPER No. XII—1974

Report of the Commission of Inquiry on Agency Houses and Brokering Firms


Printed on the Orders of Government

December, 1974

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA (CEYLON)

TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. BOX 500, SECRETARIAT, COLOMBO

Price: Rs. 25.25 Postage: Re. 1.75



G-G. O. No. N. 130/71

By His Excellency William Gopallawa, Member of the Most Excellent Order of the British Empire, Governor-General and Commander-in-Chief of the Island of Ceylon and Its Dependencies.

W. GOPALLAWA

To: Bernard Soysa, Esquire, M. P.
Dr. (Mrs.) Visakha Kumari Jayawardena
Dr. Buddhadasa Hewavitharana
Patabendi Muhandiramge Wimalasena Wijayasuriya, Esquire
Nagaratnam Nagenthiram, Esquire
Dr. Suriyapatabendige Terrence Garvin Fernando, and
Kenneth Shinya, Esquire.

GREETINGS:

WHEREAS it appears to me to be necessary to appoint a Commission of Inquiry for the purposes hereinafter mentioned.

Now, therefore, I, William Gopallawa, Governor-General, reposing great trust and confidence in your prudence, ability and fidelity, do, in pursuance of the provisions of section 2 of the Commissions of Inquiry Act (Chapter 303), by these presents appoint you the said—

Bernard Soysa, Esquire, M. P.
Dr. (Mrs.) Visakha Kumari Jayawardena
Dr. Buddhadasa Hewavitharana
Patabendi Muhandiramge Wimalasena Wijayasuriya, Esquire
Nagaratnam Nagenthiram, Esquire
Dr. Suriyapatabendige Terrence Garvin Fernando, and
Kenneth Shinya, Esquire.


be my Commissioners for the purpose of inquiring into and reporting on the following matters:

(1) the structure, organization and operation of—

(i) businesses, in Ceylon, whose activities consist of or include the management (in any of its aspects), on behalf of local or foreign principals, of any agricultural or trading ventures producing or trading in tea, rubber, coconut or other Ceylon agricultural produce whether or not such principals are themselves agents or trustees (which said businesses are hereinafter referred to as "Agency Houses"); and

මෙම වතු පෞද්ගලීකරණය කිරීම චමත්කාරජනකව ආවස්ථික සැක සහිත ආකාරයකට සිදුකර තිබූ ක්‍රියාදාමයට අනුව, මෙම ග්‍රන්ථය උචිත පරිදි 'වතු මංකොල්ලකෑම'('Pillage of Plantations') ලෙස නම් කර ඇත. කර්තෘ විසින් මෙම ග්‍රන්ථයෙන්, වටිනා ජාතික සම්පතක් වූ වතු පෞද්ගලීකරණ ක්‍රියාවලිය කරුණු සහ දත්ත සමග ගැඹුරු ලෙස විමර්ශනය කර, පෙන්වා දී තිබුණේ, මෙම වතු පෞද්ගලීකරණ කිරීම තුලින් ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට විශාල අලාභයක්, හානියක් සහ අහිතකර තත්වයක් ඇති වූයේ කෙසේද යන්න වන අතර, එය හෘද සාක්ෂිය තැතිගන්නා ලෙස එළිදරව් කර ඇත. තවද මෙම ග්‍රන්ථයේ ඉතාමත් වැදගත් ලක්ෂණයක් වන්නේ සැලකිය යුතු අදාළ කරණා සහ දත්ත රැසක් අන්තර්ගත කර තිබීමය.

එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම්, ඒ.එස්. ජයවර්ධනගේ ප්‍රධානත්වයෙන් සහ තවත් විශේෂඥයින් පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින්, සමාලෝචනයන් සිදුකර නිර්දේශ ලබා දෙමින්, 1995 පෙබරවාරි මසදී සකස් කළ වාර්තාවට අනුව, ජාතික, මහජන සහ සේවකයන්ගේ අයිතීන් සැලකිල්ලට ගනිමින් පෞද්ගලීකරණ කිරීමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එම අමාත්‍යාංශ කමිටුවේ නිර්දේශ පිළිවෙත් මත පදනම්ව මෙම වතුයායන් පෞද්ගලීකරණ ක්‍රියාවලිය සිදුකළ යුතු බවට යෝජනා කර තිබුණි. තවද කර්තෘ විසින් අමාත්‍යාංශ කමිටුවේ සභාපති වෙත නිර්දේශයන් සඳහා පුළුල් ලෙස ඉදිරිපත් කළ යෝජනා මෙම ග්‍රන්ථයේ ඇතුලත් කොට ඇත.




Report of the Committee Appointed to Inquire into

State Sector Plantations

February 1995

Ministry of Public Administration, Home Affairs, Plantation Industries and Parliamentary Affairs, No. 55/75, Vaxhall Lane, Colombo 2



MINISTRY OF PUBLIC ADMINISTRATION, HOME AFFAIRS, PLANTATION INDUSTRIES AND PARLIAMENTARY AFFAIRS

Plantation Industries Division

Minister 541539
Dep./Minister 575803
Secretary 445397
Addl./Secretary 431912
Priv. Secretary 541540 432898
Office 320901-4

6th February 1995

My No. MPI/6/1/474

Hon. Rathnasiri Wickramanayake,
Minister of Public Administration, Home Affairs,
Plantation Industries and Parliamentary Affairs,
Plantation Industries Division of the
Ministry of Public Administration,
Home Affairs, Plantation Industries and Parliamentary Affairs,
55/75, Vaxhall Lane,
Colombo 2

Dear Sir,

The Committee appointed by you to inquire into the state sector plantations has great pleasure in submitting its report.

The Committee deeply appreciates the confidence entrusted in it to undertake this task.

A.S. Jayawardane (Chairman)
R.S. Jayaratne (Member)
Ajith Goonathilake (Member)
T.P. Gunawardene (Member)
Dr. R.L. de Silva (Member)
G.B. Wickramanayake (Member)

S.M.J. Bandara (Secretary and Convener)

කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ නිර්දේශ පිළිබඳව ගණන් ගැනීමකින් තොරව, ඉතා අශෝභන ලෙස රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (PERC) විසින් බොළඳ සැක සහිත චමත්කාරජනක ආකාරයට මෙම වතුයායන් පෞද්ගලීකරණය කිරීමෙන්, ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට දැවැන්ත අලාභයන්ට හේතු වන පරිදි සිදුකර ඇති ආකාරය හෙළිදරව් වේ.

මෙම පෞද්ගලීකරණය සිදුකල රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් වූයේ:

- රාජන් අසිර්වාතම්, සභාපති, ජ්‍යෙෂ්ඨ සහකරු, ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගම
- තිලාන් විජේසිංහ, සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- චන්ද්‍රාජයරත්න, කළමනාකරණ අධ්‍යක්ෂක, CTC ඊගල් රක්ෂණ සමාගම
- සමන් කැලේගම, අධ්‍යක්ෂක, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
- අරිත වික්‍රමනායක, අධ්‍යක්ෂ ජනරාල්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
- පී.බී. ජයසුන්දර, අධ්‍යක්ෂ, ආර්ථික කටයුතු, ඒ.එස්. ජයවර්ධනගේ නාමික ලෙස
- ඒ.එස්. ජයවර්ධන, භාණ්ඩාගාර ලේකම්
- ඒ. ද වාස් ගුණවර්ධන, සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- නිමල් මලලසේකර, ඉංජිනේරු

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ගේ විශ්වාසවන්තයෙකු වූ ජේ.එම්.එස්. බ්‍රිටෝ, ලන්ඩන් නුවර සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාශයේ උපදේශකයෙකු ලෙස සම්බන්ධ වූ අතර සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සැලසුම් අධ්‍යක්ෂක, ඒ. ඒකනායකද රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ රැස්වීම් වලට සහභාගී වී ඇත. 1995 මාර්තු සිට 1995 මැයි දක්වා ඉන්ද්‍රජිත් කුමාරස්වාමි රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ක්‍රියා කර ඇත.

එම අදාල කාලය තුල, ආරාධනා මත රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ රැස්වීම් වලට ලෝක බැංකුවේ නේවාසික නියෝජිත රොබර්ටෝ බෙන්ජිරෝට්, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශක පිලිප් මෙල්කි, සහ ලෝක බැංකුවේ උපදේශකවරුන් වූ ආර්.එල්. අර්සනල්ට්, පි. ට්‍රිවේඩි, හාවිස් ෂේක්, ජෝන් ස්පික්මන්, ජුවාන් එලිස්, ටොම් හුස්ටන්, බර්කු කෙකින්, මොයින් බර්ට්ලි, ආර්.ඒ. ඩේනිස්, ජෝසප් බි. බ්‍රැඩි, කුනේයිඩා සහභාගී වි ඇත. - මෙය ශක්තිමත් කණ්ඩායමක් විය !

වාර්තා වී ඇති පරිදි, ලෝක බැංකුව, USAID සහ ආසියානු සංවර්ධන බැංකුවල අරමුදල් හා තාක්ෂණික සහාය ලබා දීම ඇතිව, විදෙස්ගත උපදේශකවරු මගින් රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පෞද්ගලීකරණ වැඩ සටහන් සඳහා සහාය ලබා දීම සිදු කරනු ලැබ ඇත.

මෙම වතු අයිති කර ගෙන තිබූ සමාගම් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයිතිව තිබුණි. මෙම වතුයායන්හි කළමනාකරණය සිදුකර ගෙන යනු ලැබුවේ තත්කාර්ය ප්‍රශ්නකාරී පදනම මත තෝරාගෙන තිබූ පෞද්ගලික අංශයේ කළමනාකරණ සමාගම් විසින් වූ අතර, තවද වතුයායන් 22 ක් කාණ්ඩ කර තිබුණේද එවැනී ආකාරයකටය.

චමත්කාර ජනක වඩාත්ම ලාභදායි වතු සමාගම් හයක ප්‍රාග්ධන කොටස් වලින් 51% ක් එම කලින් තෝරාගත් අදාල කළමණාකරණ සමාගම් වෙත අනුග්‍රහ පූර්වක පදනම මත, කොටස් වෙළඳ පොලේ එම වතු සමාගම් හයෙහි 20% ප්‍රාග්ධන කොටස් කැබලි වශයෙන් විකිණීමේ අඩුම මිල අනුව එම ප්‍රාග්ධන කොටස් 51% විකිණීමටත් සහ ප්‍රාග්ධන කොටස් 29% ශ්‍රී ලංකා රජය විසින් රඳවා ගෙන පසුව කොළඹ කොටස් වෙළඳ පොලේදී විකිණීමටත් යෝජනා වී තිබුණි. එම ප්‍රාග්ධන කොටස් 20% කොටස් වෙළඳ පොලේ කැබලි වශයෙන් විකිණීමේදී අඩුම ඉල්ලුම් මිල වන්නේ අනිවාර්යයෙන්ම කොටසක් රු. 10/- ක් වශයෙනි.

එයට ප්‍රතිවිරුද්ධව, කොළඹ කොටස් වෙළඳ පොලේ 20% ක කොටස් වලින් විකිණීම සඳහා වන ඉහළම මිල පවා 51% කොටස් ප්‍රමාණයක මිල නොවේ. ඇත්ත වශයෙන් කොටස් වෙළඳපොලේ ප්‍රාග්ධන කොටස් 20% කැබලි වශයෙන් විකිණීමේදී ලැබෙන වැඩිම මිල ප්‍රාග්ධන කොටස් 51% මිලට පවා වැඩි වන්නේය. මක් නිසාද ඒ සමඟ වතු සමාගම් වල පාලන බලය සහ භෞතික අයිතිය ලැබෙන බැවිනි.

ඒ අනුව, වඩාත්ම ලාභදායි වතු සමාගම් හය වූ බොගවන්තලාව වතු සමාගම, කොටගලවතු සමාගම, අගලවත්ත වතු සමාගම, කෑගල්ල වතු සමාගම, කොටගලව තු සමාගම සහ කැළණි වැලි වතු සමාගම ඉතා කෙටි කාලයක් තුල මේ ආකාරයෙන් අලෙවි කර ඇත.

මහජනතාව වෙත නිකුත් කරන ලද, මෙම සියලු වතු සමාගම් හය අලෙවි කිරීමට ඉල්ලුම් කර තිබූ ලේඛන වලට අත්සන් තැබූ අධ්‍යක්ෂකවරුන් වූ, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්, ආර්.එස්. ජයරත්න, ආහාර සහ සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්, ටි.පි.ජී.එන්. ලීලාරත්න, විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්, ඒම්.එෆ්. මොහිදීන්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක, එස්.ඒ.බි. ඒකනායක සහ වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂකව සිටි රොමේෂ් ඩයස් බණ්ඩාරනායකද මෙම වතු පෞද්ගලීකරණය පිළිබඳ කාර්යයේදී රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට සහායෝගය ලබා දී තිබුණි.

මෙයට අමතරව ඉහත කී ලෙස එම කලින් තෝරාගත් වතු පාලන සමාගම් වලට විශේෂ අයිතියක්ද ලබා දී තිබුණු අතර, එම වතු සමාගම් වලට පරිවර්තිත ණයකර වශයෙන් අයෝජනය කර පසුව නාමික මිල වන කොටසක් රු. 10/- බැගින් ප්‍රාග්ධන කොටස් වලට හරවා ගැනීම සඳහා එසේ විශේෂ අයිතියක් ලබා දී තිබුණි. එමගින් සත්‍ය වශයෙන්ම පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් පෙන්වා දී ඇති ආකාරයට, තෝරාගත් වතු පාලන සමාගම් වලට වතු සමාගම් වල ප්‍රාග්ධන කොටස් 51% නොව 71% දක්වා ලබා ගැනීමට හැකිවූ රහසිගත සූත්‍රයක් විය.

| නම | කොටස් ප්‍රාග්ධනය 51% රු. (මි) | පරිවර්තිත ණයකර රු. (මි) | පරිවර්තනය මත කොටස් ප්‍රාග්ධනය රු. (මි) | පරිවර්තනය මත අයිතිය % | ඵලදායී ගැනුම් මිල රු. (මි) | 20% කොටස් තනුක කරණය % |
|---|---|---|---|---|---|---|
| අගලවත්ත වතු සමාගම | 102 | 50 | 152 | 60.8% | 121.6 | 16% |
| හොරණ වතු සමාගම | 102 | 50 | 152 | 60.8% | 121.6 | 16% |
| කෑගල්ල වතු සමාගම | 102 | 50 | 152 | 60.8% | 121.6 | 16% |
| කොටගල වතු සමාගම | 102 | 120 | 222 | 69.4% | 138.7 | 12.5% |
| බොගවන්තලාව වතු සමාගම | 102 | 135 | 237 | 70.7% | 141.5 | 11.9% |
| කැළණි වැලි වතු සමාගම | 102 | 140 | 242 | 71.2% | 142.3 | 11.7% |

මිට අමතරව එම සමාගම් වලින් පාලනය කිරීමට පාලන ගාස්තුවක් ලබා ගැනීමටද පාලන සමාගම් වලට අයිතිය තිබුණු අතර, එනමුත් එම වතු පාලනය කරන්නේ කෙසේදැයි ශ්‍රී ලංකා රජයෙන් නිරීක්ෂණය කර ඇගයීම් කිරීමට ක්‍රමවේදයක් පනවා නොතිබිණි. මේ අනුව ඉහත කී ආකාරයට මිලදී ගත් ප්‍රාග්ධන කොටස් වල වටිනාකම එක් වරම තුන් ගුණයකින් කොටස් වෙලඳපොලේ මිල වටිනාකම වැඩිවීමෙන් හෘදසාක්ෂියට විරුද්ධ ලාභයක් උපයා ගනු ලැබීය.

ඉහත කී ලෙස වතු සමාගම් වල ප්‍රාග්ධන කොටස් 51% විකිණීමේ විශ්මජනක සහ හාස්‍යජනක මිල සූත්‍රය නම්කර තිබුණේ 'ස්ට්‍රයික් ප්‍රයිස් ෆොර්මියුලා' ලෙසය. ඒ අනුව, කලින් වතු සමාගම් වල ප්‍රාග්ධන කොටස් 51% නාමික මිලට මිලදී ගෙන පසුව ඉහත කී ප්‍රකාර නාමික මිලට ණයකර ද ප්‍රාග්ධන මුදල් ලෙසට හරවා ගැනීමෙන් ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට සිදු වී ඇති දැවැන්ත අලාභය පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් මනාසේ පැහැදිලිව එළිදරව් වේ.

**RECKONED ESTIMATED LOSSES SIMULATED**

| NAME | EFFECTIVE OWNERSHIP % SOLD | EFFECTIVE SALES PRICE | SHARE VALUATIONS OF OWNERSHIP % SOLD At Price/Earnings Ratios | | | RECKONED ESTIMATED LOSSES At Price/Earnings Ratios | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 8 | 10 | 12 | 8 | 10 | 12 |
| | % | Rs. M. | Rs. M. | Rs. M. | Rs. M. | Rs. M. | Rs. M. | Rs. M. |
| Agalawatte Plantations Ltd. | 60.8% | 121.6 | 403 | 503 | 604 | 281 | 382 | 483 |
| Horana Plantations Ltd. | 60.8% | 121.6 | 227 | 284 | 340 | 105 | 162 | 219 |
| Kegalle Plantations Ltd. | 60.8% | 121.6 | 383 | 479 | 575 | 262 | 358 | 454 |
| Kotagala Plantations Ltd. | 69.4% | 138.7 | 705 | 881 | 1,057 | 566 | 742 | 919 |
| Bogawantalawa Plantations Ltd. | 70.7% | 141.5 | 467 | 583 | 700 | 325 | 442 | 559 |
| Kelani Valley Plantations Ltd. | 71.2% | 142.3 | 375 | 469 | 563 | 233 | 327 | 421 |
| | | 787.3 | 2,559 | 3,199 | 3,840 | 1,772 | 2,412 | 3,053 |
| Add: Premia for controlling interests of 60.8% - 71.2% [PE 8-20%, PE 10-15%, PE 12-10%] | | | 512 | 480 | 384 | 512 | 480 | 384 |
| | | | 3,071 | 3,679 | 4,224 | 2,284 | 2,892 | 3,437 |

ඉහත කී හාස්‍යජනක සහ ප්‍රශ්නගත ලෙස වඩාත් ලාභදායී වතු සමාගම් වල ප්‍රාග්ධන කොටස් වලට, කොටසක් රු. 10/- ක නාමික මිලකට අලෙවි කිරීම පිළිබඳ කර්තෘ විසින් එවකට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග වෙත ප්‍රබල ලෙස විවේචනය කරමින් ඉදිරිපත් කිරීම් සිදු කර පෙන්වා දී තිබූ අතර, එසේ සිදුකර ඇත්තේ කිසිදු විනිවිදභාවී තරගකාරි ලංසුවකින් තොරව, කොටස් වෙළඳපොළේදී අලෙවි නොකිරීමෙනි.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් වහාම ඉහත පදනම මත වතු සමාගම් කොටස් ඉහත කී ආකාරයට අලෙවි කිරීම තහනම් කල අතර, ඇය විසින් වතු සමාගම් වල 51% ප්‍රාග්ධන කොටස් කොටස් වෙළඳපොළේ තරගකාරී ලංසු පදනමක් මත අලෙවි කල යුතු බව නිර්දේශ කරන ලදී.

ඒ අනුව අලාභ ලබන සමාගමක් වූ වටවල වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 51% ක් විකුණනු ලැබුවේ රු. මි. 306 කටය. නමුත් ලාභ ලබමින් තිබූ ඉහත කී වතු සමාගම් අලෙවි කර තිබුණේ සාපේක්ෂව රු.මි. 102 ක මිලකටය. තවද අනෙකුත් වතු සමාගම් වල කොටස් වෙළඳපොළේ විකුණුම් අනුව 51% ප්‍රාග්ධන කොටස් මිල පහත දැක්වෙන ප්‍රස්ථාරයෙන් එළිදරව් වන අතර, එක් වතුයායක් රු.මි. 622.2 කට අලෙවි කර තිබුණු බව එමගින් හෙලි වේ.

Privatisation details


| Name of plantation Phase 1 | 51% stake bidder | 51% stake method | 51% stake No. of shares (m) | 51% stake price/ share (SLR) | 51% stake Revenue (SLRm) | 20% IPO status | Revenue from 20% (SLRm) | IPO price (SLR) | 19% sale | 19% sale price/ share (SLR) | Revenue from 19% (SLRm) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Kotagala | George Steuarts MSL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Not complete | | |
| Bogawantalawa | Metropolitan MSL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Completed | 37.5 | 140.8 |
| Kegalle | RPK MSL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Completed | 31.5 | 118.2 |
| Agalawatte | Mackwoods PL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Completed | 35.5 | 133.3 |
| Horana | Ceyexxe PL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Completed | 32.0 | 120.1 |
| Kelani valley | DPL PL | Sold to Manager | 10.2 | 10.00 | 102.0 | Listed | 40 | 10 | Completed | 32.7 | 122.9 |
| **Phase 2** | | | | | | | | | | | |
| Watawala | Estate Mgt. Services Ltd | Sold on CSE | 10.2 | 30.00 | 306.0 | Listed | 60 | 15 | Completed | 61.0 | 231.8 |
| Maskeliya | RPK MSL | Sold on CSE | 10.2 | 21.50 | 219.3 | Listed | 60 | 15 | Completed | 45.0 | 171.0 |
| Madulsima | Stassen | Sold on CSE | 10.2 | 10.00 | 102.0 | Listed | 60 | 15 | Not complete | | |
| Agarapatana | Lankem PL Hold. | Sold on CSE | 7.59 | 35.25 | 267.5 | To be listed | | | Not complete | | |
| Hapugastenna | PIMC* | Sold on CSE | 10.2 | 23.75 | 242.3 | Listed | 40 | 10 | Not complete | | |
| Balangoda | Distilleries Co. | Sold on CSE | 10.2 | 41.25 | 420.8 | Listed | 80 | 20 | Completed | 40.5 | 153.9 |
| Uda Pussellawa | PIMC* | Sold on CSE | 4.84 | 65.25 | 315.8 | Listed | 19.2 | 10 | Not complete | | |
| **Phase 3** | | | | | | | | | | | |
| Mathurata | Employees Trust Fund | Sold on CSE | 10.2 | 45.75 | 466.7 | To be listed | | | Not complete | | |
| Elpitiya | Aitken Spence PL Mgt. | Sold on CSE | 10.2 | 30.25 | 308.6 | To be listed | | | Not complete | | |
| Namunukula | Keells PL Mgt. Services | Sold on CSE | 10.2 | 40.00 | 408.0 | To be listed | | | Not complete | | |
| Kahawatte | Forbes Plantation Ltd. | Sold on CSE | 10.2 | 30.25 | 308.6 | To be listed | | | Not complete | | |
| Malwatte Valley | Wayamba Plantation | Sold on CSE | 10.2 | 61.00 | 622.2 | To be listed | | | Not complete | | |
| Talawakelle + | Hayleys Ltd. | Offered to Manager | 10.2 | 40.00 | 408.0 | To be listed | | | Not complete | | |
| Pussellawa + | Free Lanka Mgt. | Offered to Manager | 10.2 | 39.00 | 397.8 | To be listed | | | Not complete | | |
| Sub total of funds raised (SLRm) | | | | | 5,405.4 | | 559.2 | | | | 1,192.0 |
| **Total funds raised (SLRm)** | | | | | | | | | | | **7,156.6** |

Note : MSL - Management Services Ltd., PL - Plantation
* PIMC - Plantation Investment & Management Co. previously government owned now 100% held by James Finliy & Co.
+ The terms of these two plantattions, which should have been sold under phase 1, had to be renegotiated before the sale was concluded under new conditions.
Elkaduwa, Chilaw and Wayamba plantations which make up the 23 regional plantations are not finalised for sale.

*Source : Public Enterprises Reform Commission*

'රන්වන් කොටස්' 'Golden Shares' නමැති කොටස ශ්‍රී ලංකා රජයේ ජාතික අයිතීන් සුරැකීම පිණිස වෙන් කර ගෙන තිබුණත්, එම කොටසේ බලය අවශ්‍ය පරිදි විග්‍රහ කොට නොතිබීමෙන් එයද හුදු නාමික කොටසක් පමණක් වූ අතර, යෝජනා කර තිබුණු නිර්දේශ අනුව වතු සමාගම් වල සේවය කරන සේවකයන්ට ප්‍රාග්ධන කොටස් වල අගයෙන්10% ලබාදීම සිදු කර නොතිබුණු අතර, එසේ සිදු කර තිබුණේ, මෙම සේවකයින් වතු සමාගම් වල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය පිටුපස සිටි ප්‍රධාන මානව බලවේගය බව නොසලකා හරිමිනි.

තවදුරටත් මෙම ග්‍රන්ථයෙන් පුදුම සහගත ලෙස අනාවරණය කර ඇත්තේ ලංකා වැවිලිකරුවන්ගේ සංගමයද ක්‍රියාකාරි වී කටයුතු කර ඇත්තේ වතු සමාගම් වල 51% ප්‍රාග්ධන කොටස් විනිවිදභාවයකින් යුතු ලංසු ක්‍රමවේදයකින් තොරව කලින් තෝරාගත් වතු පාලන සමගම් වලට ලබා ගැනීමය. එනම්:



INCORPORATED
Telegraphic Address :— "PACK" COLOMBO
Telephone :— COLOMBO, 587013
Code :— BENTLEY'S

32. Vajira Road,
P. O. Box 855,
COLOMBO 5.
SRI LANKA

PROPOSED MANAGEMENT AND EQUITY AGREEMENT

1 Divestiture of the shares of the RPCs to be made with the

JUSTIFICATION SUPPORTING THE PROPOSED METHOD OF DIVESTITURE

1 The PMCs have taken the risks associated with initial entry,

M J C Amarasuriya
CHAIRMAN -
PLANTATION MANAGEMENT COMMITTEE

3 February 1994

එවකට වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂක විසින් කිසිම වගකීමකින් තොරව - 'එවකට තිබුණු වතු පාලන සමාගම් වතු සමාගම් වල වටිනාකම ප්‍රවර්ධනය කිරීමට හිතකර අවශ්‍යතාවයන් නොතිබුණේ ඔවුන් අතර වතු සමාගම් වල කොටස් මිලදී ගැනීමට ගිවිසුමක් ඇතිකර තිබුණු බැවින් යයි ප්‍රකාශ කර තිබීම ඛේදජනක ලෙස එළිදරව් වේ.

මෙම ග්‍රන්ථය මගින් වතු සමාගම් 2ක් ඛේදජනක ලෙස පෞද්ගලීකරණය කළ ආකාරය ගැඹුරු ලෙස ගවේෂණය කොට එළිදරව් කර ඇත. එයින් එකක් කැළණි වැලි වතු සමාගම වන අතර අනෙක කොටගල වතු සමාගම වේ.

කැළණි වැලි වතු සමාගම ලාභ ලබමින් තිබූ මුලින්ම විකුණූ සමාගම් වලින් එකක් වූ අතර, එය අලෙවි කර තිබුණේ ඉහත කී පුදුමාකාර ඛේදජනක මිල සූත්‍රය අනුව රු.මි. 102 කට පමණ අගයකටය. එනමුත්, ඉන්පසු ගත වූ වසර 2½ තුල එම සමාගම රු.මි. 418 ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණි. ඊට අමතරව සැලකිය යුතු කළමනාකරණ ගාස්තු ලෙස වතු පාලන සමාගම වූ DPL වතු සමාගම වසර දෙකකට රු.මි. 53ක් ලබා ගෙන ඇත. මෙය එක් අතකින් සිත් කම්පා කරවන හෙළිදරව්වක් වේ.

ඊටත් වඩා පුදුමාකාර වන්නේ ඉහත කී අයුතු සහගත සහ හාස්‍යජනක මිල සූත්‍රය පැහැදිළි අරමුණින් ඇතිකර තිබුණේ හිතා මතාම යටිකුරු ලෙස නොමග යැවීමට 'ස්ට්‍රයික් ප්‍රයිස් ෆොර්මියුලා' සූත්‍රය ලෙස එම මිල සූත්‍රය නම් කොට වීමය. මෙම වතු පෞද්ගලීකරණයට දායකත්වය දුන් ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයෙකු වූ පිලිප් ආර්. මෙල්කි ද ඉහත කී මිල සූත්‍රය සිදු කළ කණ්ඩායමේ එක් පුද්ගලයෙක් විය.

කර්තෘ විසින් කළ ගවේෂණ අනුව විශ්මජනක ලෙස අනාවරණය කර තිබෙන්නේ ඉහත කී කැළණි වැලි වතු සමාගම ඉහත කී හාස්‍යජනක මිලකට ලබා ගෙන තිබූ DPL වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 40% ක් කෘෂි සංවර්ධන සේවා පෞද්ගලික සමාගමක් වූ සිංගප්පූරු සමාගමකට අයත් වී තිබූ බවද, එහි ප්‍රධාන කොටස්කරුවෙකු සහ අධ්‍යක්ෂවරයෙකුව සිටියේ

ඉහත කී ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයෙකු වූ පිලිප් ආර්. මේල්කි බවත්ය. එනම්:

PHILIP R. MELKYE
Director

Agricultural Development Services
(Singapore) Pte. Ltd.
3 Shenton Way #25-05A,
Shenton House
Singapore 0106
Tel : 2248286
Fax : 2253772
Telex : RS 39237 ADSADS

ADB Plantations Project
Colombo Marriott Hotel
64 Lotus Road
Colombo 1, Sri Lanka
Tel : 94-1-544-544
Fax : 94-1-449-875

TIMOTHY HOOPER
Investment Banking Specialist

Agricultural Development Services
(Singapore) Pte. Ltd.
3 Shenton Way #25-05A,
Shenton House
Singapore 0106
Tel : 2248286
Fax : 2253772
Telex : RS 39237 ADSADS

ADB Plantations Project
Colombo Marriott Hotel
64 Lotus Road
Colombo 1, Sri Lanka
Tel : 94-1-544-544
Fax : 94-1-449-875

REGISTRY OF COMPANIES AND BUSINESSES
INSTANT INFORMATION (BUSINESS PROFILE)

WHILST EVERY ENDEAVOUR IS MADE TO ENSURE THAT THE INFORMATION PROVIDED IS UPDATED & CORRECT, THE REGISTRY DISCLAIMS ANY LIABILITY FOR ANY DAMAGE OR LOSS THAT MAY BE CAUSED AS A RESULT OF ANY ERROR OR OMISSION.

THE FOLLOWING ARE THE BRIEF PARTICULARS OF:

AGRICULTURAL DEVELOPMENT SERVICES (SINGAPORE) PTE LTD

DATE OF CHANGE OF NAME: -

REG NO: 198002659H DATE OF REG: 08.08.1980

TYPE OF COMPANY : LIMITED EXEMPT PRIVATE COMPANY

REGISTERED OFFICE ADDRESS
1 COLOMBO COURT
#06-19

SINGAPORE (179742)

DATE OF CHANGE OF ADDRESS: 22.01.1990

PRINCIPAL ACTIVITY(IES):

1 BUSINESS MANAGEMENT & CONSULTANCY SERVICES

STATUS : LIVE COMPANY
EFFECTIVE DATE: -

| | AMOUNT | V/SHARE | CURRENCY |
|---|---|---|---|
| AUTHORISED CAPITAL: | 200,000.00 | 1.0000 | SINGAPORE DOLLAR |
| ISSUED ORDINARY : | 66,562.00 | 1.0000 | SINGAPORE DOLLAR |
| PAID-UP ORDINARY : | 66,562.00 | 1.0000 | SINGAPORE DOLLAR |

4) NAME : PHILIP REGINALD MELKYE
SHAREHOLDER ID : E6166260
NATIONALITY : AMERICAN
SHAREHOLDER ADDRESS :
28 TEMENGGONG ROAD
-
-
SINGAPORE (099775)
DATE OF CHANGE OF ADDRESS :01.03.1991

| | NO OF SHARES | V/SHARE | CURRENCY |
|---|---|---|---|
| ORDINARY | 39,562 | 1.0000 | SINGAPORE DOLLAR |

ඇත්ත වශයෙන්ම මෙය ආසියානු සංවර්ධන බැංකුවට ලැජ්ජා සහගත සහ ඛේදජනක සිද්ධියක් වන අතර, ඔවුන්ගේ එවැනි සැක සහිත ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට දැවැන්ත අලාභයට සහ හානියකට හේතු වූ බව සහ ඒ සඳහා ඔවුන් සම්පූර්ණයෙන්ම වගකිව යුතු වේ. *එවකට හේලීස් සමූහ සමාගමේ සභාපතිව සිටි සුනිල් මෙන්ඩිස් පසුව ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති ලෙස පත් කරනු ලැබීය.*

කර්තෘ විසින් දෙවනුව ගවේෂණය කළ තවත් පෞද්ගලීකරණය කළ වතු සමාගමක් වූයේ කොටගල වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 51% ක් අලෙවි කිරීමය. එයද මුලින් ලාභ ලබමින් තිබූ රු.මි. 102 බැගින් අලෙවි කල වතු සමාගම් හයෙන් එකකි.

කොටගල වතු සමාගම පාලනය කර තිබුණේ ජෝර්ජ් ස්ටුවර්ට්ස් මැනේජ්මන්ට් සර්විස් (පෞද්ගලික) සමාගමයි. එය ජෝර්ජ් ස්ටුවර්ට්ස් සමාගමේ 100% අයිති සමාගමක් වූ අතර, ජෝර්ජ් ස්ටුවර්ට්ස් සමාගමේ ප්‍රාග්ධන කොටස් 35% ක් අයිතිව තිබුණේ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකු සමාගමටයි.

කොටගල වතු සමාගම පුද්ගලීකරණ ගනුදෙනුව සිදුකර තිබුණේ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකු සමාගමයි. එහි සභාපති වූයේ වරලත්ගණකාධිකාරී ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගමේ ජ්‍යෙෂ්ඨ හවුල්කරු වූ රාජන් ආසිර්වතම් වූ අතර, ඔහු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ සමීප විශ්වසවන්තයෙකු විය. ඒ අනුව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ඔහුව රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස පත්කර තිබූ අතර, එම රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව එම වකවනුවේ වතු සමාගම් පෞද්ගලීකරණයේ නියැලී සිටියේය. මෙකී බරපතල අහිතකර ගැටුම් තිබියදීත්, ශ්‍රී ලංකා මර්චන්ට් බැංකු සමාගම විසින් කොටගල වතු සමාගම මිලදී ගැනීම සඳහා කැමැත්ත දැක්වූ පදනම මත කලින් තෝරාගත් ජෝර්ජ් ස්ටුවර්ට්ස් මැනේජ්මන්ට් සර්විස් (පෞද්ගලික) සමාගම වෙත මෙම ගනුදෙනුව සිදු කිරීමට ක්‍රියාකර ඇත.

සත්‍ය වශයෙන්ම පුදුමාකාර ලෙස හෙළිදරව් වන්නේ කොටගල වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 51% ක් ලබා ගෙන ඇත්තේ සැබෑ ගැනුම්කරු ලෙස විදේශ මූල්‍යායතන සමූහයේ ආයෝජකයන් කණ්ඩායමක් විසින් රු.මි. 223 කට පමණ බව ගිවිසුමකින් අනාවරණය වන අතර, එම විදේශ අයෝජකයින්ගේ කණ්ඩායමේ නියෝජිතයා ලෙස ක්‍රියාකර ඇත්තේද වරලත් ගණකාධිකාරී ෆෝර්ඩ් රෝඩ්ස් තෝන්ටන් සහ සමාගමේ හවුල්කරුවෙකු වූ එම්.ආර්. මිහියුලාය. එමගින් තවදුරටත් මේ පිළිබඳ බරපතල ගැටුම්කාරී තත්වය උග්‍රවේ.

```
a) in the case of the investors and GSMS it is addressed to

   KPMG Ford, Rhodes Thornton & Co..
   32A. Sir Macan Markar Mawatha
   Colombo 3

   for Attention : Mr. M R Mihular

   and in the case of GSL it is addressed to:

   Steuart House
   45. Janadhipathi Mawatha
   Colombo 1

   for Attention : Mr. K M de Silva
```

ජෝර්ජ් ස්ටුවර්ට්ස් මැනේජ්මන්ට් සර්විස් (පෞද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා රජයට කොටගල වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 51% මිලදී ගැනීම සඳහා රු.මි. 102ක් ගෙවා ඇති අතර, ඉතිරි රු.මි. 100 කට අධික මුදලක් 'ක්ෂණික ලාභයක්' ලෙස ජෝර්ජ් ස්ටුවර්ට්ස් මැනේජ්මන්ට් සර්විස් (පෞද්ගලික) සමාගමට උපායා ගැනීමට ඉහත කී ප්‍රකාර ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් අවස්ථාව සකස් කර තිබුණි. එයට ඔවුන් වෘත්තීයමය ගාස්තු වශයෙන් රු.මි. 4.3 ක් අයකර ගෙන තිබුණි. එනම්:

Merchant Bank of Sri Lanka Limited
P.O. Box 1987

**Private & Confidential**

20th December, 1995 Ref.No: MBSL/CF/95/567

Mr. Keerthi De Silva
Director - Finance
George Steuart & Co.Ltd
45 Janadhipathi Mawatha
Colombo - 1.

Dear Sir,

ACKNOWLEDGEMENT OF FEES

Please find enclosed the official receipt, details of which are given below:-

| | |
|---|---|
| George Steuart & Co Ltd<br>Corporate Finance & Legal Fees | Rs. 1,705,575.44 |
| George Steuart Management Services (pvt) Ltd<br>Fees for structuring the deal | Rs. 2,600,000.00 |
| Total | Rs. 4,305,575.44 |

Thanking You

Yours Faithfully

A.M.A.Cader
Manager - Corporate Finance

189, Galle Road, Colombo 3, Sri Lanka. Telephone: 423800
Telex: 23245 MERBNK CE Fax: 423799 Cable: MERCHBANK
Board of Directors: R. N. Asirwatham (Chairman) Changa J. Samaraweera (Managing Director)
Mrs. R. L. Nanayakkara, M. N. Cader, G. M. Z. Khan, M. T. L. Fernando, Deshabandu Karunaratne Jayasuriya.

ඉහත කී කොටගල වතු සමාගමේ අලෙවි කල ප්‍රාග්ධන කොටස් 51% ක ලියාපදිංචි නොකර, ලියාපදිංචි කරන ලේඛනවල ඉහත කී විදේශ මූල්‍යායතන සමූහයේ අයෝජකයන් කණ්ඩායම නම් නොකර තිබූ අතර, ඒ අනුව 'විවෘත පත්‍ර' මත තබා තිබුණි. ඒ මගින් කෙටි කලකට පසුව එම කොටගල වතු සමාගමේ ප්‍රාග්ධන කොටස් 51% ක එම විදේශ අයෝජකයන් කණ්ඩායම නැවත සීමාසහිත ලංකෙම් සිලෝන් සමාගමට රු.මි. 400 කට අලෙවි කර ඇත. එමගින් රු.මි. 200 ක පමණ ක්ෂණික ලාභයක් ඔවුන් විසින් ලබා ගෙන ඇත.

එම කාලය වන විට කොටගල වතු සමාගමේ මූල්‍ය ද්‍රවශීලතාව රු.මි. 200 ක් වී තිබූ අතර, එළිදරව් වී තිබුණේ එයද ශ්‍රී ලංකා රජය විසින් අලෙවි කල ආගරපතන වතු සමාගම මිලදී ගැනීමට ආයෝජනය කර ඇති බවය.

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව විසින් සකස් කරන ලද ඉහත කී ගනුදෙනුව විනිමය පනතේ විධි විධාන උල්ලංඝනය කර ඇති බවට චෝදනා කරමින් විනිමය පාලක විසින් එම පාර්ශවකරුවන් ඇතුළුව ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවට දඩ මුදල් පනවා තිබුණි. එම බැංකුව එම දඩ මුදල් ගෙවීම මගින්, ඔවුන් විසින් විදේශ විනිමය පනතේ විධි විධාන උල්ලංඝනය කිරීමක් සිදු කල බව පිළිගෙන ඇත.

වර්ෂ 1994 දී ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග බලයට ඒම සඳහා, මැතිවරණ වේදිකාවේ ඊට පෙර රජයෙන් කරන ලද පෞද්ගලීකරණයන් තරයේ හෙළා දකිමින්, අනාගත පෞද්ගලීකරණයන් විනිවිද භාවයකින් යුතුව, සැමටම එක හා සමානව තරගකාරිත්වයකින් යුතුව සිදු කරන බවට ප්‍රතිඥා දී ඇත. එම නිසා ඉහත කී අහිතකර පෞද්ගලීකරණයන් ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇයගේ රජය සම්පූර්ණයෙන් අපහසුවට පත්කර වන මහත් විනාශයක් විය.

ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග එම අවස්ථාවේ එසේ පෞද්ගලීකරණය කිරීම තරයේ හෙළා දකිමින් විවේචනය කර තිබුණු ආකාරය උපුටා දක්වා තිබුණේ- *'මෙවැනි වංක හා වංචනික අන්දමින් මෙවැනි ගනුදෙනු කිරීමට කිසිදු ඉඩක් නොදෙන බවය'* යනුවෙනි. එනමුත් එවැනි වංක සහ වංචනික පෞද්ගලීකරණ ගනුදෙනු කළ කිසිවෙකුට එරෙහිව කිසිදු අයුරක නිතීමය ක්‍රියාමාර්ගයක් ගනු නොලැබීමෙන්, ඇයගේ එම ප්‍රකාශය දෙඩවීමක් පමණක් ම විය. මෙයින් ඉස්මතු වන ප්‍රශ්න වන්නේ එය එසේ වූයේ ඇයගේම සමීප විශ්වසවන්තයින් හවුල් වීමෙන් මෙම ක්‍රියාවන් සිදුවූ නිසාද යන්නය. ?

මේ ආකාරයට පෞද්ගලීකරණයන් සිදු කිරීමෙන් ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට අලාභ, අහිතකර සහ හානිකර ගනුදෙනු කිරීම සම්බන්ධයෙන්, පෞද්ගලීකරණය කිරීමට අත පෙවූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල(IMF), ලෝක බැංකුව (World Bank) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වගකිවයුතු නොවන්නේද !

මෙයින් එළිදරව් වන්නේ දේශපාලනීය සහ සාමාජීය බලය ඇති පුද්ගලයින් සහ ඔවුන්ගේ 'හෙංචයියන්' විසින් කිසිම අයුරක තැති ගැන්වීමකින් සහ ලැජ්ජාවකින් තොරව කටයුත කිරීම අතිශයින් නින්දිත අධම වංචා සහ දූෂණ කිරීම හෙළා දැකිය යුතු අවලැජ්ජාවක් ලෙසය. ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ රජය විසින් 1994 ඔක්තෝබර් මස අල්ලස් පනත සංශෝධනය කරමින් දූෂණ වරදක් සේ ඇතුලත් කොට මහත් උද්‍යෝගිමත්ව වංචා සහ දූෂණය වලට එරෙහිව ක්‍රියා කරන බවට පොරොන්දු වීම සමඟ, වර්ෂ 1995 අග භාගයේදී මෙම ගනුදෙනු එසේ සිදු කරන ලදී.

එනමුත් ඉහත කී ප්‍රකාර එළිදරව් වන්නේ නීතියේ අධිපත්‍යය එම දෙඩවීම් අනුව ක්‍රියාත්මක කර නොමැති බවත් සහ එම වංචනිකයන්, වගවිය යුතු සහ වගකිවයුත්තන් සහ වැරදිකරුවන් නීතියේ රැහැනට හසුකර නොගැනීමය. පොදු දේපළ වලට අලාභ සහ හානි කිරිම 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු වැරදි පිළිබඳ පනතට අනුව බරපතල වරදකි.

මෙම ග්‍රන්ථය මගින් එළිදරව් වන පරිදි, රාජ්‍ය අංශය පමණක් නොව පෞද්ගලික අංශයද ඉතාමත් විලි ලැජ්ජාවකින් තොරව, වංචනික සහ දූෂිත ගනුදෙනු සිදු කරමින් තමුන් සඳහා අනිසි වාසි අත්කර ගනිමින් රජයට අලාභ සිදුකිරීමට කටයුතු කර ඇති බවයි. දේශපාලන වේදිකා මත බලයට ඒමට දූෂණය මර්ධනය කිරීම සඳහා ක්‍රියා කරන බවට මහා වාචාල දෙඩවීම් සිදු කරනු ලැබුවා වුවද, බලය අත්පත් කර ගැනීමෙන් පසු එම පුද්ගලයින් විසින්ම දූෂණ මඩ වගුරේ එරෙන බවය.

ඉතාමත් සැලකිය යුතු පුදුම සහගත කරුණක් වන්නේ, ඉහත කී වතු සමාගම් පෞද්ගලීකරණය කිරිම සිදු කරනු ලැබුවේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ රජය විසින්, ඇයගේ මව සිරිමා බණ්ඩාරනායක අගමැති ලෙස සිටියදී සහ බර්නාර්ඩ් සොයිසා ජ්‍යෙෂ්ඨ කැබිනට් ඇමතිවරයෙකු ලෙස සිටියදී වන අතර, ඔහුගේ 1974 වාර්තාව මත මෙම වතු ජනසතු කර තිබුණ. ඔවුන්ද ඉහත කී ක්‍රියාවලිය සඳහා පර්ශවකරුවන් වීමෙන් හෙළිදරව් කරන්නේ සමාජයේ යථාර්ථයයි. !

*වැඩි විස්තර සඳහා පිවිසෙන්න:***[http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php](http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php)**